# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**1958/62 – 2016 මාර්තු 18 වැනි සිකුරාදා – 2016.03.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2016 අංක 45 දරන ආඥාව**

මගේ යොමු අංකය : LD/05/2007/MV/110.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 6/3/7/15/5/1.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

2016 මාර්තු මස 15 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.–** ප්‍රාදේශීය ලේකම්, නාඋල.

2. **ඉඩමේ විස්තරය.–** මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගගල පල්ලේසිය පත්තුව සුළු කොට්ඨාසයේ, තලාගොඩ (කොටසක්) (අගපි 535 තුල) යන ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක MA/SG/2013/394 හා 2013.02.15 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.8930 ක් පමණ වන වේරුගොඩැල්ල නැමැති ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – වේරුගොඩැල්ල – ප්‍රමාණය: හෙක්. 0.8930 ක් පමණ**

උතුරට: ඇළ සහ ආර්. එම්. ඒ. ජී. ජයන්ත කුමාර රත්නායක හිමිකම් කියන වේරගොඩැල්ල ඉඩම; නැගෙනහිරට: ආර්. එම්. ඒ. ජී. ජයන්ත කුමාර රත්නායක හිමිකම් කියන වේරගොඩැල්ල ඉඩම සහ මාර්ග (ප්‍රා. ස.); දකුණට: මාර්ග (ප්‍රා. ස.) සහ එච්. එම්. ජී. විජේරත්න හිමිකම් කියන වේරගොඩැල්ල ඉඩම; බටහිරට: ඇළ.

04 - 329

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2016 අංක 46 දරන ආඥාව**

මගේ යොමු අංකය : LD/05/2009/PC/53.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 9/3/5/6.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 (අ) වැනි වගන්තිය යටතේ ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් අමාත්‍ය

ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

2016 මාර්තු මස 15 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.–** ප්‍රාදේශීය ලේකම්, යටවත්ත.

2. **ඉඩමේ විස්තරය.–** මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අස්ගිරි උඩසිය පත්තුව සුළු කොට්ඨාසයේ, ඊ 340 අස්ගිරි දොරකුඹුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, දොරකුඹුර ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරනලද අංක මා/1581 හා 2013.04.14 දිනැති මූලික පිඹුරේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 01 – ජංගරකොටුව වත්ත නොහොත් තල්ගහමුල වත්ත – ප්‍රමාණය: හෙක්. 0.1356**

උතුරට: ඒ. ජී. ආනන්ද සහ වයි. ජී. ලොකු බණ්ඩා හිමිකම් කියන ජංගරකොටුව වත්ත නොහොත් තල්ගහමුලවත්ත; නැගෙනහිරට: මාතලේ ඇටිපොල (ප්‍රා. ස.) මාර්ගය; දකුණට: ඊ. එම්. ඊ. පී. සෙනවිරත්න හිමිකම් කියන ජංගරකොටුව වත්ත නොහොත් තල්ගහමුලවත්ත; බටහිරට: ඒ. ජී. ආනන්ද හිමිකම් කියන ජංගරකොටුව වත්ත.

04 - 330

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2000 ජූලි මස 10 වැනි දින අංක 1140/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2000 අංක 150 දරන ආඥාවේ කැබලි අංක 01 සිට 127 දක්වා සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි 1 වන උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 13/95/IR/280(3 සැතපුම).
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: කැළ/16/ඉඅ/197(3 සැතපුම).
2016 මාර්තු මස 15 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, කැළණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අධිකාරි පත්තුව සුළු කොට්ඨාසයේ අංක 262ඒ මැවැල්ල, අංක 263 සිංහාරමුල්ල, අංක 263ඒ පිලපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසවල කැලණිය ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මූ. පි. ගම් 3788 සහ 2015.10.22 දිනැති මූලික පිඹුරේ සවිස්තරව පෙන්නුම් කර ඇති පහත සඳහන් නම්වලින් සහ ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 299 – අඹගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0178 ක් පමණ**

උතුරට: එල්. වරාගොඩ හිමිකම් කියන අඹගහවත්ත, මෙම ඉඩමේ ඉතිරි කොටස වූ ශාන්ත ආනා දෙව්මැදුරට අයත් අඹගහවත්ත, බී. ඒ. සී. පෙරේරා සහ බී. ඒ. ඊ. පෙරේරා හිමිකම් කියන අඹගහවත්ත; නැගෙනහිරට: කැබලි අංක 48 සහ 49; දකුණට: කැබලි අංක 300; බටහිරට: කැබලි අංක 72 සහ එල්. වරාගොඩ හිමිකම් කියන අඹගහවත්ත.

04 – 331

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39 (1) වැනි වගන්තිය යටතේ ආඥාව අවලංගු කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 1887/9 හා 2014.11.03 වැනි දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද්දාවූ ද, 2014 අංක 305 හා 2014.10.27 වැනි දරන ආඥාවේ ඉඩම් කැබලි අක්ෂර 'ඒ' ලෙස පෙන්නුම් කර ඇති ඉඩම් කොටස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ.

එනමුත් මේ කියන ලද ඉඩම් කොටසේ භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවම භාරගෙන නැත. එබැවින්, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39 (1) වැනි වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල අනුව අංක 1887/9 හා 2014.11.03 වැනි දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ

පළ කරන ලද ඉහත සඳහන් 2014 අංක 305 හා 2014.10.27 දින දරන ආඥාවේ පහත උපලේඛනයේ සඳහන් කැබලි අක්ෂර 'ඒ' දරන ඉඩම් කොටස මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4 - 3/12/2014/UDA/46.

ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: තිප්‍රාලේ/1/8/3/45අත්.

2016 මාර්තු මස 15 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නාරාහේන්පිට, (කොට්ඨාස අංක 34, නාරාහේන්පිට, කොළඹ මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/THI/2014/ 296 සහ 2014.06.16 වැනි දින දරන ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0206 ක් පමණ වන ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – වරි. අංක 103, කාසල් වීදිය – ප්‍රමාණය: හෙක්. 0.0206**

උතුරට: බෞද්ධාලෝක මාවත; නැගෙනහිරට: බෞද්ධාලෝක මාවතේ වරි. අංක 532 දරන ඉඩම; දකුණට: කාසල් වීදිය; බටහිරට: කාසල් වීදිය සහ බෞද්ධාලෝක මාවත.

04 – 332

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.